# 10 ශ්‍රේණිය බුද්ධ ධර්මය

## 06 පාඩම


සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය


chamindavijeekumara@gmail.com


දු.ක. අංකය :- 0718416477, 0702035765

# 06 පාඩම

# සසුන් කෙත සරු කළ, උතුමෝ ගුණැති පෙරකළ

# වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ







# සරණංකර හිමියන් පහළ වන යුගයේ මෙරට පැවති සමාජ ශාසනික තත්ත්වය

- ❖කන්ද උඩරට රාජධානිය නායක්කාර් වංශික අබෞද්ධ රජවරුන්ගේ පාලනයට යටත් වීමෙන් දේශීය බෞද්ධ සංස්කෘතික ක්‍රමයෙන් පරිහානියට පත් වෙමින් පැවතීම
- ❖ එක් උපසම්පදා භික්ෂුවක් හෝ සොයා ගැනීම අසීරු වන තරමට ශාසනය පරිහානියට පත්ව තිබීම
- ❖අධ්‍යාපනය ලැබීමට පොත්පත් මෙන් ම ගුරුවරුන් ද සොයා ගැනීම ඉතා ම දුෂ්කර වීම
- ❖භික්ෂූන් නමින් පෙනී සිටි ඇතැම්හු අඹුදරුවන් පෝෂණය කළ අතර ඇතැම්හු ධනවත් රදල පවුල්වලට පණිවිඩ ගෙන යාම් ආදී මෙහෙවර කිරීම
- ❖එමෙන් ම ඔවුහු ධර්ම විනය පිළිබඳ දැනුමෙන් මෙන් ම ශික්ෂණයෙන් ද පිරිහී සිටීම

# සරණංකර හිමියන් ශාසනික දියුණුව උදෙසා කළ කාර්යයන්

- බුද්ධ ශාසනය නගා සිටුවීමේ අධිෂ්ටානයෙන් ශාසනමාමක පිරිස් සංවිධානය කිරීම
- ඒ සඳහා “සිල්වත් සමාගම” නමින් සංවිධානයක් පිහිටුවා ගැනීම
- දුසිල්වතුන්ගේ බාධක හිරිහැර මැද පා ගමනින්ම ගම් දනව් සිසාරා වඩිමින් ධර්මය දේශනා කරමින්, පැවිදි වීමට කැමති බොහෝ පිරිසක් සිල්වත් සමාගමට එක් කර ගැනීම
- බොදු දූ දරුවන්ගේ ශාසනමාමක බව ද දියුණු කිරීමට ක්‍රියා කිරීම
- ධර්ම ඥානය මෙන් ම වත් පිළිවෙත් ප්‍රගුණ කර සසුනේ චිර පැවැත්ම කැමති භික්ෂූන් වහන්සේ බිහි කිරීමට කටයුතු කිරීම

# සරණංකර හිමියන් ශාසනික දියුණුව උදෙසා කළ කාර්යයන්

- කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ උදවු ඇතිව සියම් දේශයෙන් උපසම්පදාලාභී භික්ෂූන් වහන්සේලා මෙරටට මෙරටට වැඩම වීම
- සරණංකර හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේලා හය නමක් උපසම්පදාව ලබා ගැනීම
- උඩුනුවර නියම කන්දේ පිරිවෙනක් පිහිටුවීම
- අනුරාධපුර, දඹුල්ල, පොළොන්නරුව ආදී බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරවා නිසි පරිදි පුද පූජා පැවැත්වීමට කටයුතු කිරීම
- මහනුවර පැවැත් වූ දේවාල පෙරහැරට ශ්‍රී දන්ත ධාතූන් වහන්සේට උපහාර දැක්වීමේ මාලිගාවේ මහ පෙරහැර ද එක් කිරීම
- වටිනා ධර්ම ග්‍රන්ථ රැසක් රචනා කිරීම

# සරණංකර හිමියන් විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ

**මුණිගුණාලංකාරය**

වැලිවිට සරණංකර හිමි

**සාරාර්ථ සංග්‍රහය**

වැලිවිට සරණංකර හිමි

**රතනත්‍රය ප්‍රණාම ගාථා සන්නය**

වැලිවිට සරණංකර හිමි

**සතර බණවර සන්නය**

වැලිවිට සරණංකර හිමි

# සරණංකර හිමියන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ

- ✓ත්‍රිවිධ රත්නය පිළිබඳ ව අපරිමිත ශ්‍රද්ධාවෙන් යුක්ත වීම
- ✓ශික්ෂාකාමී හා අල්පේච්ඡ ව ජීවත් වීම
- ✓විවිධ දුෂ්කරතා මැද වුව ද අධ්‍යාපනය පිළිබඳ දැඩි ඇල්මක් දැක්වීම
- ✓සිසු දරුවන්ට උදවු කිරීමට තිබූ කැමැත්ත
- ✓නාරහංකාර බව
- ✓ස්ථිර අධිෂ්ඨානය

# දුටුගැමුණු මහ රජතුමා





# දුටුගැමුණු රජතුමාගෙන් සිදු වූ සමාජ ශාසනික සේවාව

- විදේශීය ආක්‍රමණිකයන්ගෙන් රට ජාතිය බේරා ගැනීම
- සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා කටයුතු කිරීම
- මහා සංඝ රත්නය කෙරෙහි ගෞරවයෙන් කටයුතු කිරීම
- මහා විහාරය වඩාත් අංග සම්පූර්ණ ලෙස විවිධ ගොඩනැගිලි වලින් යුක්ත ව දැකුම්කලු සුවිසල් බෞද්ධ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම
- සෑම ගමක ම ධර්ම දේශකයන් ලවා ධර්ම දේශනා පැවැත්වීමට ධර්ම පූජා සිදු කිරීමට ද කටයුතු සැලසීම
- වෙසක් උත්සවය පැවැත්වීම
- ආරෝග්‍යශාලා පිහිටුවා ගිලන්හල් සේවාවක් ආරම්භ කිරීම

- බෞද්ධ ලෝකයාගේ මුදුන්මල්කඩක් බඳු රුවල්වැලි සෑය ඉදිකිරීම හා තවත් වෙහෙර විහාර හැට අටක් දිවයිනේ විවිධ ප්‍රදේශවල කරවීම



- ලෝවාමහා ප්‍රාසාදය යනුවෙන් හැඳින්වෙන අසිරිමත් ගොඩනැගිල්ල ඉදි කරවීම



- දුටුගැමුණු මහ රජතුමා තමා විසින් මිරිස් ව්‍යාංජනයක් භික්ෂූන් වහන්සේලාට නොපුදා අනුභව කිරීම නිසා එයින් තමාට පවක් සිදු වූයේ යැයි සිතා මිරිසවැටිය චෛතය ඉදි කළේය



# දුටුගැමුණු රජතුමාගේ චරිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශ

- රටේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ස්ථිර අධිෂ්ඨානයෙන් යුතු ව කටයුතු කිරීම
- සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතියත් සංවර්ධනයත් උදෙසා ශ්‍රද්ධාවෙන් හා ඕනෑකමින් කටයුතු කිරීම
- සංඝරත්නයේ අවවාද අනුශාසනා පිළිගැනීම හා ඔවුන් කෙරෙහි ගෞරවයෙන් කටයුතු කිරීම
- යුද්ධයේ දී මිය ගිය ප්‍රතිවාදියාට පවා ගරු කිරීම
- ධර්ම ශ්‍රවණයට දැඩි කැමැත්තක් දැක්වීම
- අවස්ථාව ලද සෑම විටම පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වීම

# තෙරුවන් සරණයි...!